### කම්මං බෙත්තං

අවිද්‍යාවෙන් වැසී ගිය දෙනුවන් පුරා
වසාගත් තණ්හාවේ ජල කඳ උතුරා
විඤ්ඤාණේ බිජු සරුවට වපුරා
නෙලමු අස්වනු කම්මං කෙතේ
උනුන් පරදවලා
බුදු සමිඳුණේ තවම අපි
සසර මඟ රැඳිලා

මේ මගේ අවසන් උපත බව කීවා
උපතේ මුල භවයමැයි දුටුවා
උපාදානයේ ඵළය මේ යැයි
ලොවට ඔබ කීවා සමිඳුණි
මනුසතුන්හට උතුම් දම් දෙසුවා

ලොවේ දස දෙස ඔබේ
ගුණ රැඳුණාවේ
සවන් පුරවා මිහිරි බණදම්
නිතර ඇසුණාවේ
දහම් සිසිලෙන් දැවුනු හදවත්
නිබඳ නිවුණාවේ

තණ්හාවේ ජල කඳ වියැළී
විඤ්ඤාණේ බීජද බොල් වී
කම්මං කෙතෙන් බැහැර වීලා
සොයා යමු අපි
ඔබ කියා දුන් නිවන් මඟ සොයලා
බුදු පුතනුවණි පිහිට වෙනු මැන
දහම් ඇස පාද!

(කිරිබත්ගොඩ ඤාණානන්ද හිමියන්ගේ විස්මිත අවබෝධය - පටිච්ච සමුප්පාදය නම් වූ කෘතිය පරිහරණයෙන් පසු ඇති වූ සිතුවිල්ලකි)

කේ නයනා එල් පෙරේරා

### සහෝදර කවිය

වෙඩි සද්දෙ නැවතුණා දොරකඩ
ඇහෙනවද? දොර කවුළු ඇරෙන හඬ
අලුත් සුළඟක් ඇවිත්
ධර්මපාල,
සරෝජිනී ,
සිවපාලන්,
ලලිතක්කේ මෙහෙ වරෙන්

මන්නාරමෙන්,
තිස්සමහාරාමෙන්,
අම්පාරෙන්,
වන්නියෙන් කොහෙන් හරි
මේ සුසුමක මායිම පෙන්වන්න
හැකි වෙයිද? කෙනෙකුට

මතක් කරපන් මහා උදම් රළ
මුද ගොඩ දාපු දා
යාන්තම් පණ ගැහුණ
මනෝහරන් ගොඩ දැම්මෙ
වාඩියේම සෝමදාස
ඇඳිවත ගැලවුණා එදත්
නොදැක්කට අපේ නිරුවත

මග වැරදුණා තමයි
වන්දි ගෙව්වා බොහෝම..
කාලයයි දැන්
"ඒ-නයින් " පාරෙන් ඇවිත්
බැඳගන්න අත්වැල්
මේ අලුත් පොළොවක්
බීජ වපුරන්න
හෙට පිපෙන අලුත් මල් වලට

රංජිත් ගමගේ
රියාද් නගරය



### භීෂණයේ මරණය

සිසිරයේ කටුක සීතලෙන්
පස් යට සැගවුන බීජ
වසන්තයේ අව්රැල්ලෙ උණුසුමින්
නව දලුළමින්
ලෝකය දකින්න උඩට එනව

අවියට බියව සැගවුන හොඳ නො හොඳ
අදහසුත් එහෙමයි

භීෂණයේ මරණයත් සමග

හොඳ අදහස් සරුව වැඩෙන්න
සහෝදරත්වයේ උනුසුම් රන් දෑතින්
බිම් සකසන්න

පුදින සැබෑ සාමයේ කුසුමින්
ලක්මව පුදන්නට

කල පවක් ඇත්නම් එය මැකෙන්න

නිහාල් රූපසිංහ

### ළඳරු සහ මහළු සිත

විළක් වගෙයි නිසල
දඟ කළත් ළඳරු සිත
මුහුද වාගෙයි කැළඹී
හුදෙකලා මහළු සිත

සාමන්ත තැන්නගේ

# පහන් වැට



### වන පෙත අසිරිය

මේ තුරු වන පෙත කිම අසිරිය ගෙන
වින්ටරයේ සිහිතල විඳමින් සුව
මා බිය වූවත් වින්ටර සුළඟට
වන පෙත හිනැහෙයි මා අබියස අද
මා සැම දින යන වේ මග අසබඩ
වන පෙත අසිරිය නැත හමු වී පෙර
වාහන දුම්රිය අතරේ හිර වී
ගිය දින දැක නැත වන පෙත අසිරිය
මා මන සැනසෙයි වන පෙත දැක්මෙන්
වින්ටරය ද මට සතුරෙක් වූ දින
වන පෙත අසිරිය දසුනේ මවමින්
පැනයක් විමසයි සීතල මනසින්
ජීවිතය ද වෙද දැක නැති වන පෙත
ඇවිදින කල දැක නැත දිවි මං පෙත
කිම මේ වන පෙත ගැන ලතවන්නේ
වන පෙත සිරි නොබලා නොම යන්නේ

සුනිල් ගෝවින්නගේ
ජුන්ඩලප්, බටහිර ඔස්ට්‍රේලියාව